VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 Police Park Place, Colombo 05, Sri Lanka
Tel: + 94 112055544; Fax: +94 719379567
Email: reception@veriteresearch.org


# බාලගිරි දෝෂයකට හසු වී ඇති අයවැය ඉලක්කයන්

ආදායම ඉක්මවා වියදම් කිරීම යනු රාජ්‍යයකට වුවද දැරීමට අපහසු ආර්ථික සාර්ථකත්වය විපතේ හෙළීමට සෘජුවම හේතුවන සාධකයකි. එබැවින් අයවැය හිඟය අඩු කිරීම සඳහා ක්‍රමික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ආර්ථිකයක යහපැවැත්මට ඉතා වැදගත් වේ. රජයකට අයවැය හිඟය අඩු කිරීම සඳහා ඇති අධිෂ්ඨානය ඉතා යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්තියක් වේ. මෙහිදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් වන්නේ අයවැය ප්‍රතිපත්තයේ ස්ථාවරත්වය හා සාර්ථකත්වය තීරණය කෙරෙන එකම සංරචකය අයවැය හිඟය නොවන බවයි. රාජ්‍ය ආදායම ක්‍රමිකව අඩුවන වාතාවරණයක් හමුවේ අයවැය හිඟය අපේක්ෂිත මට්ටමේ පවත්වාගෙන යෑම අභියෝගයක් බවට පත්වන අතර ඒ පසුපස ලුහුබැඳීම ආර්ථිකයට ද පීඩාකාරී වේ.

දළ දේශීය නිෂ්පාදනයේ (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස 8% ක් පමණ ඉහළ මට්ටමක පැවති අයවැය හිඟය යුද්ධයේ නිමාවත් සමගම ක්‍රමිකව අඩුවන ප්‍රවණතාවයකට ගෙන ඒමට රජය සමත් විය. 2013 සඳහා ඇති අයවැය හිඟය පිළිබඳ ඇස්තමේන්තුව ද.දේ.නි.යෙන් 5.8% පමණ වන අතර එය සැබෑ ලෙසම සාක්ෂාත් කරගත් මට්ටම නම් අයවැය හිඟයේ වාර්තාගත අඩුවීමක් වේ. මීට සමගාමීව ද.දේ.නි. 12.8% ක් ලෙස වාර්තා වූ රාජ්‍ය ආදායම් මට්ටම ද වාර්තාගත ලෙස අඩු වීමකට භාජනය විය. මේ ආකාරයට අයවැය හිඟය සහ රාජ්‍ය ආදායම් සංරචක දෙකම එකවිට අඩුවීම ගැටළුකාරී තත්ත්වයක් වන අතර එය ආර්ථිකයේ යහපැවැත්මට ද හානිකාරී වේ.

අප මුලින්ම අයවැය හිඟය දෙසට අවධානය යොමු කරමු. අයවැය හිඟය අඩුකිරීම පිළිබඳ ඉලක්කයන් දිගුකාලයක් තිස්සේ ප්‍රමාද කිරීම් වලට බඳුන් වූ කාරණයකි මහින්ද චින්තන ප්‍රතිපත්තිය විසින් 2005 දී ඉදිරිපත් කළ සැලසුම් වලට අනුව 2011 වන විට අයවැය හිඟය 5% ක මට්ටමකට ගෙන ඒමට අපේක්ෂිත විය (රූප සටහන් 01). නමුත් 2009 වන විටත් අයවැය හිඟය ද.දේ.නි.යෙන් 9.9% ක් වැනි ඉහල අගයක් ගත් අතර මෙවැනි පසුබිමක් තුළ 5% ක් අපේක්ෂිත ඉලක්කය 2013 තෙක් කල් දැමීමට සිදු විය. 2012 දී මෙම ඉලක්කය නැවත 2015 වනතෙක් කල් දැමීමට ක්‍රියා කරන ලදී. අයවැය හිඟය 5% ක අපේක්ෂිත ඉලක්කය කරා ළඟාවන ප්‍රවනතාවය පැහැදිලිව දක්නට ලැබුන ද එය තවමත් සැබෑවක් කරගැනීමට නොහැකි වී ඇත.

**රූප සටහන 01 : අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශයක් ලෙස**





මූලාශ්‍රය : *මහින්ද චින්තනය - 2005/ෆිස්කල් කළමණාකරණ වාර්තාව 2010*

2005 මහින්ද චින්තන ප්‍රතිපත්තය ඉදිරිපත් කිරීමේදී 2010 වන විට රාජ්‍ය අදායම ද.දේ.නි.යෙන් 20% ක මට්ටමකට ගෙන ඒමට අපේක්ෂිත විය. නමුත් යථාර්ථය මීට ප්‍රතිවිරුද්ධ විය. එනම් රාජ්‍ය ආදායම ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ක්‍රමික අඩුවීමකට ලක් වූ අතර 2009 වන විට අපේක්ෂිත අයවැය ඉලක්කයන් 2005 නැවත වෙනස් කිරීමකට ලක් විය.

එමෙන්ම පශ්චාත් යුධ සමය තුළ විශාල අයෝජකයන්ට ලබා දෙන ලද 'උපාය මාර්ගික නොවන' විශාල සහනයන් හේතුවෙන් කෙටිකාලීන මෙන්ම දිගකාලීන රාජ්‍ය ආදායම් මූලාශ්‍රයන්ට දැඩි පහරක් වැදුනු අතර එමගින් බදු ගෙවන ආයතන වල බදු දායකත්වය ද අවතක්සේරු වීමට හේතු විය *(මේ පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් 'වෙරිටේ රිසර්ච්' - 2014 අවයැව වාර්තා විග්‍රහය මගින් සපයා ඇත).*

2012 ඉපැයූ රාජ්‍ය ආදායම් 2009 දී සිදු කළ පුරෝකථනයන් වඩා අඩුවීම හේතු කොටගෙන නැවත වරක් සංශෝධනයකට ලක් කරන ලදී. 2009 පුරෝකථනයට අනුව 2013 වන විට රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් 17% ක අගයකට ගෙන ඒමට අපේක්ෂිත විය. කෙසේ වුවද 2012දී මෙම පුරෝකථනයන් නැවතත් වෙනස් කරමින් 2015 වන විට අපේක්ෂිත රාජ්‍ය ආදායම ද.දේ.නි. 15.1% වැන අඩු අගයකට ගෙන එන ලදී (මෙය 2006 දී සාක්ෂාත් කරගත් රාජ්‍ය ආදායමට වඩා 2% කින් අඩු ප්‍රතිශතයකි). මෙලෙස රාජය ආදායම අඩුවන ප්‍රවණතාවක් තුළ අයවැය හිඟය අඩු මට්ටමක පවත්වාගෙන යන්නේ කෙසේද යන ගැටළුවට පිළිතුරු සෙවීම ඉතා වැදගත් වේ.


රූප සටහන 02 : රාජ්‍ය ආදායම ද.දේ.නි. ප්‍රතිශයක් ලෙස




මූලාශ්‍රය : *මහින්ද චින්තනය - 2005/ෆිස්කල් කළමණාකරණ වාර්තාව 2010*

පසුගිය වසර කිහිපය තුළම රජය මේ සඳහා පසුගාමී උපායමාර්ගික උපක්‍රමයක් භාවිතා කරන ලදී. එනම් ප්‍රාග්ධන වියදම් (රාජ්‍ය ආයෝජනය) කප්පාදු කිරීමයි. 2005 දී රාජ්‍ය ආයෝජනය ද.දේ.නි.යෙන් 8% ක් වැනි ඉහළ අගයක පවත්වාගෙන යෑමට අපේක්ෂිතව පුරෝකථනයන් සිදුකරන ලදී (රූප සටහන 03). නමුත් රාජ්‍ය ආදායම අඩුවන වාතාවරණයක් තුළ අයවැය හිඟය සහ රාජ්‍ය වියදම් දැඩි පීඩනයකට ලක් වන අතර අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට මෙම සංරචක දෙකම හෝ අවම වශයෙන් එකක් හෝ සංශෝධනයට ලක් කිරීමට සිදු වේ. රාජ්‍ය අයෝජන වියදම් කප්පාදුව මෑත කාලය තුළ මෙම අරමුණ ඉටු කර ගැනීමට රජය විසින් අනුගමනය ජනප්‍රිය වරණය විය. රාජ්‍ය ආයෝජන පුරෝකථනයන් 2009 දී 6% ක (ද.දේ.නි. ප්‍රතිශයක් ලෙස) මට්ටමට පහළ හෙලූ අතර සැබෑ දත්ත විශ්ලේෂණයේදී පෙනී යන්නේ පසුගිය වසර 02 ක කාලය තුළ රාජ්‍ය ආයෝජන වියදම ද.දේ.නි.යෙන් 6% කට වඩා අඩු මට්ටමක පැවති බවයි (එනම් 1990 දී පැවති මට්ටමට සමගාමීව).

රූප සටහන 03 : රාජ්‍ය ආයෝජනය ද.දේ.නි. ප්‍රතිශයක් ලෙස





මූලාශ්‍රය : *මහින්ද චින්තනය - 2005/ෆිස්කල් කළමණාකරණ වාර්තාව 2010*

අයවැය හිඟයක් පවතින සෑම විටකම එය පියවීම සඳහා රජයට ණය ලබා ගැනීමට සිදු වේ. 2005 දී රාජ්‍ය ණය ඒ වන විට පැවති 90% ක පමණ මට්ටමේ සිට 2010 වන විට ද.දේ.නි.යෙන් 70% ක මට්ටමකට අඩු කිරීමට අපේක්ෂා කරන ලදී. නමුත් අපේක්ෂිත ලෙස අයවැය හිඟය පහතට ගෙන ඒමට අපොහොසත් වූ වාතාවරණයක් තුළ රාජ්‍ය ණය අපේක්ෂිත මට්ටමට පහතට ගෙන ඒමට රජය අපොහොසත් විය. මේ අනුව 2009 වන විටත් රාජ්‍ය ණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 80% ඉක්මවූ අගයක පැවතුණි. මෙහිදී රජය නැවතත් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම කල් දැමීමේ ප්‍රතපත්තිය අනුගමනය කරමින් 2012 දී නව පුරෝකථනයන් ඉදිරිපත් කරන ලදී. එමගින් රාජ්‍ය ණය 70% අපේක්ෂිත මට්ටමට ගෙනඒම 2014 දක්වා කල් දමනු ලැබීය. නැවත වරක් 2014 අයවැය ඉදිරිපත් කිරීමත් සමගම මෙම ඉලක්කය 2016 දක්වා කල් දමනු ලැබීය (රූප සටහන 04).

"කිසිදු ප්‍රයත්නයක් නොදරා සිටීමට වඩා යම් කිසි ප්‍රයත්නයන් දරා අසමත්වීම වටී". රජය අයවැය හා සම්බන්ධ ඉලක්කයන් මුදුන්පත් කර ගැනීමට උත්සාහ දරන බවක් පෙනෙන්නට තිබුණ ද ඒ සඳහා භාවිතා කරන ක්‍රමවේදයෙහි අඩුලුහුඩුකම් පවතී.

**රූප සටහන 04 : රාජ්‍ය ණය ද.දේ.නි. ප්‍රතිශයක් ලෙස**




**මූලාශ්‍රය : *මහින්ද චින්තනය - 2005/ෆිස්කල් කළමණාකරණ වාර්තාව 2010***

'වෙරිටේ රිසර්ච්' විසින් ඉදිරිපත් කරන 2014 අයවැය විශ්ලේෂණ වාර්තාවට අනුව අපේක්ෂිත අයවැය ඉලක්කයන් මුදුන්පත් කර ගැනීමට සිදු කරන රාජ්‍ය වියදම් කප්පාදුව තුළ ප්‍රමුඛ අංශයන් බවට පත්ව ඇත්තේ රාජ්‍ය ආයෝජන වියදම සහ ඉතා වැදගත් සමාජ සේවා වියදම් හා පොදු භාණ්ඩ ගණයෙහි ලා සැලකෙන අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා වෙන්කොට ඇති ප්‍රතිපාදයන් ය. නමුත් ආදායම් ඉපැයීමේ ශක්‍යතාවයක් අඩු එමෙන්ම වෙනත් අත්‍යවශ්‍ය නොවන වැඩසටහන් (මිහින් එයාර්, දැයට කිරුළ වැනි) සඳහා අයවැය මගින් ඉතා විශාල ප්‍රතිපාදයන් වෙන් කිරීම නිරතුරුව සිදු වේ.

වැටුප්, විශ්‍රාම වැටුප් හා පොලී ගෙවීම් යන අනිවාර්ය වැය ශීර්ෂයන්ට වාර්ෂිකව රජයේ පුනරාවර්තන වියදමින් 70% ක පමණ ප්‍රතිශතයක් වැය වේ. එබැවින් රාජ්‍ය ආදායම අඩුවන වාතාවරණයක් තුළ අයවැය හිඟය අඩු කිරීම, රාජ්‍ය ණය අඩු කිරීම හා රාජ්‍ය ආයෝජන ඉහළ මට්ටමක පවත්වාගෙන යාම යන කරුණු සියල්ල එකවිට සපුරා ගැනීම දුෂ්කර කටයුත්තකි. එබැවින් රාජ්‍ය මූල්‍ය කටයුතු මනා කළමණාකරණයකින් යුතුව පවත්වාගෙන යෑමට නම් අත්‍යවශ්‍ය වියදම් වලට ප්‍රමුඛත්වය දීමත්, අනවශ්‍ය වැය ශීර්ෂයන් කපා හැරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. නමුත් 2014 අයවැය දෙස විමර්ශනාත්මකව බැලීමේදී පෙනී යන්නේ අපේක්ෂිත අයවැය ඉලක්කයන් සපුරා ගැනීමට බලාපොරොත්තු වන කාල සීමාවන් නැවත නැවතත් දිගු කිරීමට සිදුවන සේයාවකි.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**